# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2455/26 - 2025 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2025.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : හල්/3/2/1/28.

*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 03J/92/FR/65.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ /පරවශතාවේ විස්තර* :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ සුළු කොට්ඨාසයේ, කොලොන්ගස්තැන්න (154ඒ) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දියම්ගොල්ල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද, පිඹුරු අංක අ. භූ.පි. 46 හි අතුරු පිඹුර 7 හා 2024.02.03 වැනි දින දරන පිඹුරේ කැබලි අංක 1AF, වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 8.1300 පමණ වූ ඉඩම්වල විස්තර පහත දැක්වේ :-

**01. කැබලි අංක 01 AF**

ඉඩමේ නම: ඊරියකැටියකැලේ; විස්තරය: කැළය; හිමිකම් කියන අය: අංක 404, රජමල්වත්ත,මොරටුව හි පදිංචි අමරසිංහ ආරච්චිගේ දොන් හේමපාල අමරසිංහ මයා; ප්‍රමාණය: හෙක්ටයාර් 8.1300

මායිම් විස්තර :

*උතුරට* : කැබලි අංක 1AG, 21, 1AE, 23, 25 ½ සහ 25;
*නැගෙනහිරට*: කැබලි අංක 21, 1AE, 23, 25 ½ , 25 සහ 1;
*දකුණට*: කැබලි අංක 1 ; *බටහිරට* : කැබලි අංක 1AG

අරමුණ - කැළෑ ඉඩම් සංරක්ෂණය සඳහා ඊරියකැටිය කැලේ ඉඩම අත් කර ගැනීම

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2025 දෙසැම්බර් මස 17 වැනි දින පෙ. ව. 10.00ට හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 දෙසැම්බර් මස 10 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**කේ. ඒ. ජේ. ප්‍රියංගිකා,**
ප්‍රාදේශීය ලේකම්,
හල්දුම්මුල්ල.

2025 සැප්තැම්බර් මස 22 වැනි දින,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0236